සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



දෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 13 - 2020**

විභාග අංකය .............................

# බෞද්ධ ශිෂ්ටාචාරය I

කාලය පැය දෙකයි

**වැදගත්**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න.**

01. ගුණය හා කර්මය සැලකිල්ලට ගෙන මහා බ්‍රහ්ම විසින් චතුර්වර්ණය මවන ලද බව සඳහන් වන්නේ,
(1) ඍග්වේදයේය. (2) මනුස්මෘතියේය. (3) භගවත් ගීතාවේය.
(4) මහාභාරතයේය. (5) අර්ථශස්ත්‍රයේය.

02. බුද්ධකාලීන භාරතීය ආගම් හා දර්ශනවාද අතර ශාස්සතවාදය හා නියතිවාදය හඳුන්වා දෙන ලද්දේ,
(1) පූරණ කස්සප හා පකුධකච්චායන ශාස්තෘවරයාය.
(2) පකුධකච්චායන හා මක්ඛලී ගෝසාල ශාස්තෘවරයාය.
(3) මක්ඛලී ගෝසාල හා අජිත කේශකම්බලී ශාස්තෘවරයාය.
(4) අජිත කේශකම්බලී සංජය බෙල්ලට්ඨිපුත්ත ශාස්තෘවරයාය.
(5) සංජය බෙල්ලට්ඨිපුත්ත හා නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයාය.

03. බ්‍රාහ්මණයන් විසින් කුලීන වර්ණයන්ගේ මෙලොව මෙන් ම පරලොව අභිවෘද්ධියට නොවරදින ඒකායන මාර්ගය ලෙස නිර්දේශ කරන ලද ශුද්ධ වූ ආගමික ක්‍රියාකාරකම වූයේ,
(1) ආශ්‍රමධර්ම ක්‍රියාවලියයි. (2) උපනයන ක්‍රියාවලියයි. (3) ආපද්ධර්ම ක්‍රියාවලියයි.
(4) යාගකර්ම ක්‍රියාවලියයි. (5) ස්වධර්ම ක්‍රියාවලියයි.

04. චතුර් වර්ණයට අයත් ස්වධර්ම පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ අන්‍ය වර්ණයන්ට කළ නොහැකි බ්‍රාහ්මණ වර්ණයට පමණක් ම නිර්දේශිත වු ක්‍රියාකාරකම් පැවති බවයි. එසේ බ්‍රාහ්මණ වර්ණයට පමණක් අනන්‍ය වු ක්‍රියාකාරකම් දෙකක් වනුයේ,
(1) වේදය හැදෑරීම හා යාග කිරීමය. (2) දන්දීම හා යාග කිරීමය.
(3) වේද අධ්‍යයනය හා දන් දීමය. (4) වේදය ඉගැන්වීම හා යාග කරවීම.
(5) වේද අධ්‍යයනය හා දන් පිළිගැනීමය.

05. ඒ ඒ වර්ණ සඳහා නිර්දේශිත කාර්යයන් මනුස්මෘතියෙහි දක්වා ඇත්තේ,
(1) ස්වධර්ම නමිනි. (2) ආශ්‍රම ධර්ම නමිනි. (3) නියාම ධර්ම නමිනි.
(4) ආපද් ධර්ම නමිනි. (5) වර්ණ ධර්ම නමිනි.

06. බ්‍රහ්මජාල සූත්‍රයට අනුව **"එවන්ති'පි මේ නෝ තථාති'පි මේ නෝ අඤ්ඤථාති'පි මේ නෝ නෝති'පි මේ නෝ නෝ නෝති'පි මේ නෝ......** යනාදි ලෙසින් මහජනයා වික්ෂිප්තියට පත්වන අයුරින් දර්ශනයක් ඉදිරිපත් කළ බුද්ධකාලීන ශාස්තෘවරයකු වූයේ,
(1) පූර්ණ කස්සපය. (2) පකුධ කච්චායනය. (3) සංජය බෙල්ලට්ඨිපුත්තය.
(4) අජිත කේසකම්බලිය. (5) මක්ඛලි ගෝසාලය.

07. හිසෙහි ජටාවක් දරමින්, සංචාරක පැවිදි දිවියක් ගත කරමින්, ඇතැම් විට ස්ථිර ආරාමවල ජීවත් වෙමින්, ගිනි දෙවියන් පුදමින් හා උදක ශුද්ධියට ද ප්‍රමුඛත්වයක් ලබා දෙමින් කටයුතු කළ ශ්‍රමණ සම්ප්‍රදාය වන්නේ,
(1) නිගණ්ඨය. (2) ජටිලය. (3) ආජීවකය. (4) පරිබ්‍රාජකය. (5) අචේලකය.

08. බුද්ධකාලීන බාහිරක ශ්‍රමණ චින්තනය තුළ විශාල අනුගාමිකයින් පිරිසකට නායකත්වය ලබා දෙමින් කටයුතු කළ ආගමිකයන් අතර ෂට් ශාස්තෘවරු ප්‍රමුඛ වෙති. මොවුන් විසින් විවිධ දර්ශන ඉදිරිපත් කරන ලදී. ඔවුන් සියලු දෙනා ම බැහැර කළ ආගමික මතයක් නම්,

(1) සියලු ම මිනිස්සු මරණයෙන් උච්ඡේදයට පත්වන බවයි.
(2) සියලු දෙනා නියතියකට අනුව සසර ගමන් කරන බවයි.
(3) කිසිවකු කරන හොඳ හෝ නරක ක්‍රියාවකට විපාකයක් නැති බවයි.
(4) පුද්ගලයාගේ අභිවෘද්ධියට කර්ම මාර්ගය අත්‍යවශ්‍ය බවයි.
(5) සියලු දෙනා සදාතනික පරමාණු පදාර්ථවලින් නිර්මාණය වී ඇති බවයි.

09. ප්‍රඥා ප්‍රතිලාභයට සහ ආධ්‍යාත්මික ප්‍රගතියට ස්ත්‍රී භාවය බාධාවක් නොවන බව දේශනා කළ බුදුරජාණන් වහන්සේ , භික්ෂූන්ට මෙන්ම භික්ෂුණීන්ට ද තනතුරු ලබාදීමට උත්සුකවූ සේක. ඒ අනුව අභිඤ්ඤාලාභී භික්ෂුණීන් අතර අග්‍රස්ථානය හිමිකරදෙන ලද්දේ,
(1) මහා ප්‍රජාපතී ගෝතමී තෙරණියටය. (2) උප්පලවණ්ණා තෙරණියටය.
(3) පටාචාරා තෙරණියටය. (4) ඛේමා තෙරණියටය.
(5) කුණ්ඩලකේසී තෙරණියටය.

10. බුද්ධකාලීන භාරතයේ සොළොස් මහා ජනපද පිළිබඳ විවිධ තොරතුරු බෞද්ධ හා ජෛන මූලාශ්‍රවල අනාවරණය වෙයි. ඒ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) කොසඹෑනුවර අගනගරය වූ අවන්තියේ චණ්ඩපජ්ජෝත රජු පාලකයාය.
(2) විශාලාව අගනගරය වූ වජ්ජි රාජ්‍යයේ සංඝතන්ත්‍ර පාලනයක් පැවතියේය.
(3) රජගහනුවර අගනගරය වූ මගධයේ කොසොල් රජු පාලකයාය.
(4) විශාලා මහනුවර අගනගරය වූ මල්ල රාජ්‍යයේ ගණතන්ත්‍ර පාලනයක් පැවතියේය.
(5) සැවැත් නුවර අගනගරය වූ කෝසල රාජ්‍යයේ ගණතන්ත්‍ර පාලනයක් පැවැතියේය.

11. ''චණ්ඩපජ්ජෝත'' රජු තෙරුවන් සරණ ගියේ,
(1) මුගලන් තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
(2) ආනන්ද තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
(3) පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
(4) මහාකාශ්‍යප තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.
(5) මහාකච්චායන තෙරුන් වහන්සේගෙන් ධර්මය ඇසීමෙනි.

12. ආර්ය ජනාවාස ආරම්භයට පෙර සිට ම කෘෂිකර්මාන්තය ප්‍රබල ජීවන වෘත්තියක් ව පැවති බව භාරතීය ඉතිහාසය විමසීමේදී ප්‍රකට වේ. බෞද්ධ සාහිත්‍යාගත මූලාශ්‍රයන්හි සඳහන් වන ආකාරයට කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට රාජානුග්‍රහය ලබාදිය යුතු බව දැක්වෙන සූත්‍රය වන්නේ,

(1) දීඝ නිකාය උදුම්බරික සීහනාද සූත්‍රයයි. (2) දීඝ නිකාය අග්ගඤ්ඤ සූත්‍රයයි.
(3) දීඝ නිකාය සාමඤ්ඤඵල සූත්‍රයයි. (4) දීඝ නිකාය කූටදන්ත සූත්‍රයයි.
(5) දීඝ නිකාය මහා ගෝවින්ද සූත්‍රයයි.

13. බුදුරජාණන් වහන්සේ ශාශ්වත හා උච්ඡේද යන අන්තද්වයට නො පැමිණ සුන්දර වූ නිවනට ගිය බැවින් ද, එම නිවනට යහපත් ආකාරයෙන් ගිය බැවින් ද, සුදුසු තැන, සුදුසු වචන යහපත් ව දේශනා කරන බැවින් ද උන්වහන්සේ සතු වූ ගුණය හඳුන්වන්නේ,

(1) භගවා නමිනි. (2) සුගත නමිනි. (3) ලෝකවිදූ නමිනි. (4) අරහං නමිනි. (5) බුද්ධ නමිනි.

14. බුදුරජාණන් වහන්සේගේ විදර්ශනා ඥානය හෙවත් ලෝකයේ ඇත්ත ඇති සැටියෙන් දක්නා නුවණ ප්‍රඥාව වන අතර එය ලෝකය හා ජීවිතය පිළිබඳව උන්වහන්සේ සතු ව පැවැති ගැඹුරු වූ ඥාන ශක්තියයි. බුද්ධ ශරීරය කොතරම් දුර්වල වුව ද උන්වහන්සේගේ ප්‍රඥා ශක්තියෙහි කිසිදු වෙනසක් නොවේය' යි. පැහැදිලි කෙරෙන සූත්‍රය නම්,
(1) මජ්ඣිම නිකායේ මහාසීහනාද සූත්‍රයයි. (2) මජ්ඣිම නිකායේ වීමංසක සූත්‍රයයි.
(3) මජ්ඣිම නිකායේ චූලගෝසිංහ සූත්‍රයයි. (4) මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයයි.
(5) මජ්ඣිම නිකායේ ධම්මචේතිය සූත්‍රයයි.

15. "මිනිස් වර්ගයාගෙන් වැඩි ම සංඛ්‍යාවකින් පූජා ලද තැනැත්තා ලෙස ඉතා පහසුවෙන් ම වෙන් කොට දැක්විය හැක්කේ බුදුරජාණන් වහන්සේ ය." යනුවෙන් බුදුරජාණන් වහන්සේ පිළිබඳ ඇගයීම් කළ විද්වතා වන්නේ,

(1) ඇල්බට් අයින්ස්ටයින්ය. (2) බර්ට්‍රන්ඩ් රසල්ය.
(3) මහාචාර්ය සෝණ්ඩර්ස්ය. (4) මහාචාර්ය මැක්ස් මුලර්ය.
(5) එඩ්වින් ආර්නෝල්ඩ්ය.

16. "**පුණ්ඩරීකං යථා වග්ගු - තෝයේන නූපලිප්පති, නූපලිප්තෝම්හි ලෝකේන - තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ**" යන ගාථා පාඨයෙන් තථාගතයන් වහන්සේ විසින් තමන් වහන්සේ කවුරුන්දැ'යි හඳුන්වාදෙන ලද බ්‍රාහ්මණයා වන්නේ,

(1) අක්කෝසක බමුණාය. (2) චංකී බමුණාය. (3) අග්ගික භාරද්වාජ බමුණාය.
(4) ද්‍රෝණ බමුණාය. (5) සෝණදණ්ඩ බමුණාය.

17. දෙවියන් සහිත ලෝකයාට දිට්ඨධම්මික, සම්පරායික යන උභයාර්ථ සිද්ධිය පිණිස අනුශාසනා කරන බැවින් ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයකු වූ බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න විසඳූ ක්‍රම අතර චූල්ලකම්ම විභංග සූත්‍රය අයත් වන්නේ,

(1) විභජ්ජ ව්‍යාකරණීය ක්‍රමයටය. (2) ඨපනීය ක්‍රමයටය.
(3) ඒකංස ව්‍යාකරණීය ක්‍රමයටය. (4) පටිපුච්ඡා ව්‍යාකරණීය ක්‍රමයටය.
(5) අත්තජ්ඣාසය ක්‍රමයටය.

18. බුද්ධකාලීන භාරතයේ විසූ ශාස්තෘවරුන් වෙනත් ආගමික ශාස්තෘන් මුණගැසීමට හෝ ඔවුන් සමඟ සාකච්ඡාකිරීමට කැමැත්තක් දක්වා නැත. එහෙත් බුදුරජාණන් වහන්සේ අන්‍යතීර්ථක ආරාමවලට වරින්වර වැඩමවා ඔවුන් සමඟ සුහදව සාකච්ඡා කළ බව බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වේ. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති මෙම ගුණය

(1) අරහං ගුණයයි. (2) තාදී ගුණයයි.
(3) මහා කරුණා ගුණයයි. (4) පුරිසදම්ම සාරථී ගුණයයි.
(5) ආගමික සහනශීලී ගුණයයි.

19. බුදුරජාණන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කළ දින පැවිදි වූ ආනන්ද මහ තෙරුන් වහනසේ, සම්බුද්ධත්වයෙන් විසි වන වසරේදී ආයාචනා හතරක් හා ප්‍රතික්ෂේප හතරක් ඉදිරිපත් කොට නිත්‍ය උපස්ථායක ධුරයට පත් වූහ. එයින් ආනන්ද මහතෙරුන් වහන්සේගේ ප්‍රතික්ෂේප හතරට අයත් නොවන්නේ,

(1) බුදුරජාණන් වහන්සේට කෙරෙන ආරාධනාවලට තමා පිටත් කර නො හැරිය යුතු බව.
(2) බැහැරින් පැමිණෙන කවරකු හෝ කැමති වේලාවක බුදුරජාණන් වහන්සේ මුණ ගැස්වීමට අවසර නොදිය යුතු බව.
(3) බුදුරජාණන් වහන්සේට ලැබෙන පිණ්ඩපාතය තමාට නොදිය යුතු බව.
(4) බුදුරජාණන් වහන්සේ වසන එක ම ගඳකිළියේ තමාට විසීමට ඉඩ නො දිය යුතු බව.
(5) බුදුරජාණන් වහන්සේට ලැබෙන චීවර තමාට නොදිය යුතු බව.

20. උපතිස්ස පරිබ්‍රාජකයා හා කෝලිත පරිබ්‍රාජකයා බුදුසසුනෙහි පැවිද්ද ලැබූ ආරාමය වන්නේ,
(1) වේළුවනාරාමය. (2) ජේතවනාරාමය. (3) ඝෝෂිතාරාමය.
(4) පූර්වාරාමය. (5) ඉසිපතනාරාමය.

21. මහා ප්‍රජාපතී ගෝතමිය ආනන්ද තෙරුන් වහන්සේගේ පූර්ණ අනුග්‍රහය ද ඇතිව අෂ්ට ගරුධර්ම පිළිගෙන විශාලා මහනුවර කූටාගාර ශාලාවේ දී සම්බුද්ධත්වයෙන් -------------------- පැවිදි උපසම්පදාව ලැබුවාය.
(1) සිව්වන වසරේදී (2) පස්වන වසරේදී (3) තෙවන වසරේදී
(4) නවවන වසරේදී (5) අටවන වසරේදී

22. රූපාවචර ධ්‍යාන සතර ම ලබාගත් අනාගාමී උපාසකතුමෙකු වූ චිත්ත ගහපතිතුමා ඔහුගේ මිතුරෙකු වූ අන්‍ය ආගමික ------------- නිවැරදි මාර්ගය පෙන්වා දී ඔහු පැවිදි කරවා සිවුපසයෙන් සංග්‍රහ කළේය.
(1) අචේල කස්සපට (2) දීඝනඛට (3) පිලෝතිකට
(4) අභයරාජට (5) වච්ඡගොත්තට

23. **අත්තකාර, පරකාර, ආරම්භක ධාතු, නික්කම ධාතු, පරක්කම ධාතු, ථාම ධාතු, ඨිති ධාතු, උපක්කම ධාතු** යන ඉගැන්වීම් මඟින් අර්ථවත් කෙරෙන්නේ,

(1) බුද්ධකාලීනව ප්‍රචලිතව පැවති පුද්ගල ස්වාධීනත්වයට හානිකර වූ ඉගැන්වීම් බවය.
(2) අදෘශ්‍යමාන නියතියකට පුද්ගල පෞරුෂය යටත් වන බවය .
(3) හොඳ - නරක තමා විසින් ම තීරණය කොට, ක්‍රියා කිරීමේ පුද්ගල ශක්තිය පවතින බවය.
(4) තමාට තමා හැර වෙනත් ස්වාමියකු හෝ තමා පාලනය කරන අදෘශ්‍යමාන බලයක් හෝ නොපවතින බවය.
(5) තමා පාලනය කරන අදෘශ්‍යමාන නිර්මාණවාදී බලයක් හෝ පවතින බවය.

24. බුදුරජාණන් වහන්සේ විසින් දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේදී දක්වන ලද පැහැදිලි කිරීම්වලට අදාළ නොවන වරණය තෝරන්න.

(1) සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය, පරිණාමය හා විකාශය හේතුප්‍රත්‍යය වන බව.
(2) සමාජ ප්‍රභවය හා විකාශය ඊශ්වර නිර්මාණවාදය මත පදනම්ව නොපවතින බව.
(3) සමාජ ප්‍රභවය හා විකාශය පාරිසරික, ආර්ථික, දේශපාලනික, ආචාර විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක සාධක බලපා ඇති බව. .
(4) බෞද්ධ රාජ්‍යත්වයේ ප්‍රභවය ප්‍රජාතාන්ත්‍රීය හා ජනහිතකාමී ලක්ෂණවලින් යුතු බව.
(5) සමාජ ප්‍රභවය හා විකාශය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම නියතිවාදී මූලධර්මයන් මත පදනම්ව ඉදිරිපත් වී ඇති බව.

25. බෞද්ධ ජාතක කථා සාහිත්‍යයෙහි දැහැමින් රට පාලනය කරන රජකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් දහයක් සඳහන් වන අතර, හා ඒවා දශරාජ ධර්ම නමින් ප්‍රකට ය. එම දශරාජ ධර්ම අතර **රජු අගතිගාමී නොවී අවංකව ක්‍රියා කළ යුතු බව** දැක්වෙන ධර්මය නම්,

(1) පරිත්‍යාගය. (2) සීලය. (3) ඉවසීම (4) ඍජු බව (5) මෘදු බව

26. බුදුරජාණන් වහන්සේ ---------------- සූත්‍රයේදී තමාට හා අනුන්ට මෙන් ම දෙපක්ෂයට ම අයහපතක් වන ක්‍රියා නරක ක්‍රියා ලෙසත් යහපතක් වන ක්‍රියා හොඳ ක්‍රියා ලෙසත් පෙන්වා දුන් සේක.

(1) වේළුද්වාර (2) කාලාම (3) ආධිපතෙය්‍ය (4) අම්බලට්ඨික රාහුලෝවාද (5) නිබ්බේධික

27. ලිහිණියාගම සුහද බෞද්ධ කලණ මිතුරු සංගමයේ සාමාජිකයෝ පුරුද්දක් ලෙස, නිරතුරුව ම ගමේ ප්‍රජා ශාලාවට රැස්වූහ. ගමේ සංවර්ධනය පිළිබඳ දිගුවේලාවක් සාකච්ඡා කරන ඔවුන් ඉතා සමගියෙන් විසිර යන්නේ, නැවත හමුවීමේ අපේක්ෂාවෙනි. ගමේ සිටින වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිගත් ඔවුහු ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේට විශේෂයෙන් ගරුබුහුමන් කළහ. මෙම කලණ මිතුරන්ගේ ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි වන්නේ,

(1) ඔවුහු සතර අගතියෙන් තොර පිරිසක් බවයි.
(2) ඔවුහු පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කරන පිරිසක් බවයි.
(3) අපරිහානිය ධර්ම අනුව දිවිගෙවන පිරිසක් බවයි.
(4) ඔවුහු ලෝකපාලක ධර්ම අනුගමනය කරන පිරිසක් බවයි.
(5) ඔවුහු ආගමික සංහිඳියාව අගයන පිරිසක් බවයි.

28. ලද පමණින් සතුටු වීම, පහසුවෙන් පෝෂණය කළ හැකි වීම, සැහැල්ලු දිවි පෙවෙතක් ගත කිරීම, ඉන්ද්‍රිය සංවරය, සරල පැවැත්ම මඟින් --------------- අර්ථවත් වෙයි.

(1) බහුකිච්ඡතාව (2) අල්පේච්ඡතාව (3) මහිච්ඡතාව
(4) සංතුෂ්ටිය (5) අල්පකිච්ඡතාව

29. පරිසර සංරක්ෂණය සඳහා අදාළ කරගත හැකි අගනා උපදෙස් රැසක් බුදුසමයෙහි ඇතුළත් වේ. විනය ශික්ෂාවන්හි පරිසර සංරක්ෂණයට අදාළ විනය නීති පැන වූ බුදුරජාණන් වහන්සේ, භික්ෂූන් වහන්සේලා විසින් ගස්වැල් සිඳීම හා සියලු ආකාරයේ පැළ වන බීජ සිඳීමට පණවා වදාළ විනය නීතිය හඳුන්වන්නේ,

(1) පාරාජිකා ලෙසය. (2) නිසගි ලෙසය. (3) පචිති ලෙසය.
(4) සංඝාදිසේස ලෙසය. (5) ආපත්ති ලෙසය.

30. ව්‍යාපාරයක් පිරිහීයෑමේ හේතු මැනවින් දැන, ඒවා වළකා ගනිමින් ගොඩනැගිලි හා යන්ත්‍ර සූත්‍රාදිය මනාව නඩත්තු කරමින් නුවණින් වියදම් මෙහෙයවමින් කළමනාකරණ සඳහා ප්‍රතිපත්ති හතරක් අංගුත්තර නිකායේ කුල සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් සේක. එම ප්‍රතිපත්ති හතරට අයත් නොවන්නේ,

(1) යුතුකම් හා වගකීම් වෙනුවෙන් තම දැහැමි ධනය කැප කිරීම.
(2) පමණ දැන පරිභෝග කිරීම.
(3) සදාචාර සම්පන්න අයෙකු ප්‍රධානත්වයෙහි තැබීම.
(4) විනාශ වූ දේ යළි සම්පාදනය කර ගැනීම.
(5) දිරා යන පරණ වන දේ ප්‍රතිසංස්කරණය කරගැනීම.

31. උට්ඨාන වීර්යයෙන්, දැතේ මහන්සියෙන්, ශ්‍රමෝපයෝගයෙන් ධාර්මිකව උපයන ලද ධනය තමාට හිමිවීමෙන් ඇතිවන සුවය හඳුන්වන්නේ,

(1) අනණ සුඛ නමිනි. (2) භෝග සුඛ නමිනි. (3) අණවජ්ජ සුඛ නමිනි.
(4) සාමිස සුඛ නම් නමිනි. (5) අත්ථි සුඛ නමිනි.

32. **"න අත්ත හේතු න පරස්ස හේතු - න පුත්තමිච්ඡේ න ධනං න රට්ඨං**
**න ඉච්ඡෙය්‍ය අධම්මේන සමිද්ධිමත්තනෝ - ස සීලවා පඤ්ඤවා ධම්මිකෝ සියා"** යන ධම්මපද ගාථාවෙහි අදහසට වඩාත් ගැළපෙන වරණය වන්නේ,
(1) අනුන්ගේ පිහිට නොපතා තමාට තමාම පිහිට විය යුතු බවය.
(2) තමාගේ මෙන් ම මෙරමාගේ යහපත උදෙසා කටයුතු කළ යුතු බවය..
(3) යම් දෙයක් හිත වේද යහපත් වේද ඒ දෙය සිදුකිරීම ඉතාම අමාරු බවය.
(4) තමා නිසා හෝ අනුන් නිසා හෝ පවක් නො කළ යුතු බවය.
(5) තමාට මෙන් ම අනුන්ට ද ධර්මය හැර පිහිටක් නොමැති බවය.

33. සිගාලෝවාද සූත්‍රාගත සදිසා නමස්කාරයෙන් සමාජයේ යහපැවැත්මට අදාළව දක්වා ඇති යුතුකම් සංඛ්‍යාව හැට එකකි. එම යුතුකම් අතරට ඇතුළත් **"මිහිරි ආහාරපානාදිය නිසිලෙස බෙදාදීම"** සිදුකළ යුත්තේ,

(1) භාර්යාව විසින් ස්වාමියාටය. (2) ගිහියන් විසින් පැවිදි උතුමන්ටය.
(3) සේවකයන් විසින් ස්වාමියාටය. (4) ස්වාමියා විසින් භාර්යාවටය.
(5) ස්වාමියා විසින් සේවකයන්ටය.

34. බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වාසය කරද්දී දෙවි මිනිසුන් වෙනුවෙන් ඉල්ලීමක් කළ එක්තරා දෙවියකුගේ ආරාධනයෙන් මෙලොව පරලොව සුගතිගාමී කර ගැනීමට ඉවහල් වන මංගල කරුණු තිස් අටක් දේශනා කළ සේක. එයින් **"නිවාතෝ ච" "සෝව චස්සතා"** යන්නෙහි අදහස අයත් වරණය වන්නේ,

(1) තිදොර මනාව හික්මවීම හා යහපත් පැවතුම් ඇති බවයි.
(2) නිවැරදි කර්මාන්තය හා කෙලෙස් රහිත බවයි.
(3) යහපත් පැවතුම් ඇති බව හා කීකරුකමයි.
(4) බඹසර විසීම හා යහපත් පැවතුම් ඇති බවයි.
(5) කෙලෙස් රහිත බව හා කීකරුකමයි.

35 **''භාග්‍යවතුන් වහන්ස, කිඹුල්වත්පුරයේ මග දෙපස ඇති මනරම් මහා වෘක්ෂයන්හි පරණ කොළ හැලී ගිනි අඟුරු මෙන් රත්පැහැති දලු ඇත. භාග්‍යවතුන් වහන්ස, කිඹුල්වත්පුරයේ දේශගුණය යහපත්ය. සීතල ද අධික නැත. උෂ්ණත්වය ද අධික නැත. සෘතුව යහපත්ය. වීරයන් වහන්ස, මෙය නික්ම යාමට සුදුසුම කාලයයි.''** යනුවෙන් ප්‍රකාශ කළේ,

(1) සැරියුත් තෙරුන් වහන්සේය. (2) කාළුදායි තෙරුන් වහන්සේය.
(3) මහා කාශ්‍යප තෙරුන් වහන්සේය. (4) මුගලන් තෙරුන් වහන්සේය.
(5) ආනන්ද තෙරුන් වහන්සේය.

36. කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේ ------------- ප්‍රදේශයට වැඩම කොට ඥාති වර්ගයා ඇතුළු ප්‍රදේශවාසීන් සසුන් ගත කිරීමට කටයුතු කළ සේක.

(1) සුණාපරන්ත (2) කුරු (3) කාසි (4) දෝණවත්තු (5) ඉච්ඡානංගල

37. බිම්බිසාර රජතුමාගේ ඉල්ලීමට ප්‍රතිචාර වශයෙන් බුද්ධත්වයට පත්ව පළමුවරට බුදුරජාණන් වහන්සේ මගධයේ රජගහනුවරට වැඩමකරනු ලැබුවේ,

(1) දුරුතු පුරපසළොස්වක පොහෝ දිනයේය.
(2) ඇසළ පුරපසළොස්වක පොහෝ දිනයේය.
(3) බක්මස අමාවක පොහෝ දිනයේය.
(4) මැදින්මස පුර අටවක පොහෝ දිනයේය.
(5) උඳුවප් පුර පසළොස්වක පොහෝ දිනයේය.

38. පළමු ධර්ම සංගායනාවට හේතු ගණනාවක් බලපා ඇතිබව ශාසන ඉතිහාසය විමසීමෙන් පැහැදිලිවේ. එම හේතූන් දුරස්ථ හා ආසන්න හේතූන් වශයෙන් වර්ගීකරණයකට ලක්කළ හැකිය. ඒ අනුව පළමු ධර්ම සංගායනාවට බලපෑ ආසන්න හේතුවක් වූයේ,

(1) දෙව්දත් තෙරුන් මුල්කරගෙන ඇතිවූ ශාසන අර්බුදයි.
(2) විසිරී පැවැති ධර්ම විනය ගොනුකර ගැනීමේ අවශ්‍යතාවයි.
(3) කොසඹෑනුවර ඝෝෂිතාරාමයේ ඇතිවූ ධර්මධර විනයධර භික්ෂු ගැටුමයි.
(4) ඡන්න තෙරුන්ගේ හිතුවක්කාර ක්‍රියාපිළිවෙතයි.
(5) නාගසමාල, උපවාන, නාගිත ආදි භික්ෂූන්ගේ නොහික්මුණු ක්‍රියාකලාපයි.

39. තෙවන ධර්ම සංගායනාවේ වැදගත් ප්‍රතිඵලයක් ලෙස ථෙරවාදී බුදු දහම දේශාන්තර වශයෙන් ව්‍යාප්ත කරලීමට පියවර ගැනීම දැක්විය හැකිය. නවරට සසුන් පිහිටුවීමේ කාර්යයේදී මහිස මණ්ඩලයට ධර්ම ප්‍රචාරය සඳහා වැඩම කළ ධර්මදූත කණ්ඩායමේ ප්‍රධානියා වූයේ,

(1) මහා ධම්මරක්ඛිත තෙරුන්ය.
(2) රක්ඛිත තෙරුන්ය.
(3) යෝනක ධම්මරක්ඛිත තෙරුන්ය.
(4) මජ්ඣන්තික තෙරුන්ය.
(5) මහාදේව තෙරුන්ය.

40. චක්‍රවර්තී රාජ්‍ය සංකල්පය යම් තරමකට හෝ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරලීමට උත්සහගත් පාලකයෙකු ලෙස ධර්මාශෝක අධිරාජයන් ඉතිහාසගත වේ. එතුමා විසින් අනුගමනය කළ ආගමික සහනශීලිත්වය ප්‍රකටවන ක්‍රියාකාරකමක් වන්නේ,

(1) සෙවණ හා ආහාර පිණිස මග දෙපස ගස් සිටුවීම.
(2) ගෝත්‍රික ජනයා ශිෂ්ටත්වයට පත්කිරීමට කටයුතු කිරීම.
(3) බරාබර් ලිපිවලට අනුව ආජීවකයන්ට ආරාම පූජාකිරීම.
(4) මිනිසුන්ට මෙන් ම තිරිසන් සතුන්ට ප්‍රතිකාර කිරීමට කටයුතු කිරීම.
(5) ශාසන දායාදය ලබාගනුවස් සිය දරු දෙදෙනා සසුන්ගත කරවීම.

41. කණිෂ්ක රජතුමා බුදුසමය වැලඳගැනීමෙන් අනතුරුව බුදුසමයේ සංරක්ෂණය, සංවර්ධනය හා ව්‍යාප්තිය වෙනුවෙන් මහත් මෙහෙවරක් ඉටු කළ පාලකයෙකු වශයෙන් සම්භාවනාවට පාත්‍රවී ඇත. බුදු සමයේ උන්නතිය වෙනුවෙන් මෙතුමා කළ ප්‍රමුඛ කාර්යයක් වනුයේ,
(1) දුසිල් මහණුන් සසුනෙන් නෙරපා ශාසනය පිරිසිදු කිරීමය.
(2) ථෙරවාදී බුදු දහම දේශාන්තරයන්හි ව්‍යාප්ත කිරීමය.
(3) ථෙරවාදී ධර්ම සංගීතියක් පැවැත්වීමය.
(4) විසිරී පැවැති ථෙරවාදී ධර්මය ඒකරාශී කිරීමය.
(5) ධර්මය තඹ තහඩුවල ලියා තැන්පත් කිරීමය.

42. නාලන්දා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු ප්‍රධාන විෂයධාරා පහක් යටතේ සිදු කර ඇත. එම විෂය ධාරාවන්ට අදාළ විෂයයන් රැසක් තිබිණි. ඒ අනුව ලෞකික විෂය ධාරාවට ඇතුළත් විෂයක් ලෙස සැලකෙනුයේ,
(1) කැටයම් කලාව. (2) චතුර්වේදය. (3) තාරකා විද්‍යාව. (4) ව්‍යාකරණ. (5) මූර්ති ශිල්පය.

43. ප්‍රාග් බෞද්ධ යුගයේදී මෙරට ජෛන ආගම ව්‍යාප්තව පැවැති බවට සාක්ෂියක් ලෙසින් ඇතම් ජෛන සාධුවරුන් උදෙසා පණ්ඩුකාභය රජු ආරාම ඉදිකරදීම පෙන්වාදිය හැකිය. එවැනි එක් ජෛන සාධුවරයෙක් වූයේ.
(1) ව්‍යාධ දෙවියාය. (2) ජුතින්ද්‍රය. (3) මහේජ ය. (4) කුම්භාණ්ඩය. (5) වෛශ්‍රවණය.

44. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලාංකික ජනජීවිතය බෞද්ධ සාරධර්මවලින් පෝෂණය විය. කරුණාව, මෛත්‍රිය, අවිහිංසාව හා පරෝපකාරය වැනි ගුණධර්ම මෙරට වැසියන්ගේ හදවත් තුළ වැඩී ගියේ බුදුසමයේ ආභාසයෙනි. මාඝාත වැනි නීති පැණවීමෙහිලා බලපෑවේ ද බුදුසමයයි. මාඝාත නීතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) මිනිසුන්ට මෙන් ම සතුන්ට ද දයාවෙන් සැලකීමට පැණවූ නීතියයි.
(2) පූජෝත්සවවලදී බිලිපූජා තහනම් කිරීමයි.
(3) සත්ව ඝාතනය සම්පූර්ණයෙන් ම තහනම් කිරීමයි.
(4) මිනිස් ඝාතන තහනම් කිරීමයි.
(5) සියලු සත්වයෝ සුවපත්වෙත්වා'යි මෙත් වැඩීමට පැණවූ නීතියයි.

45. වට්ටගාමිණීඅභය, වෝහාරිකතිස්ස, ගෝඨාභය, මහසෙන්, පළමුවනසේන යන රාජ්‍ය සමයන් තුළ භාරතයේ ජනප්‍රිය වී තිබුණු විවිධ බෞද්ධ නිකායික ඉගැන්වීම් මෙරට ව්‍යාප්ත කරලීමට ඇතැම් පිරිස් උත්සහගත් බවක් දක්නට ලැබේ. එබඳු නිකායික ඉගැන්වීමක් වූ වෛතුල්‍යවාදය මැඩපැවැත් වූ පාලකයෙකු ලෙස ප්‍රකට වන්නේ,

(1) දුටුගැමුණු රජය. (2) මහසෙන් රජය. (3) වට්ටගාමිණීඅභය රජය.
(4) පළමුවන සේන රජය. (5) ගෝඨාභය රජය.

46. බුදුදහම මෙරටට ලැබීමෙන් අනතුරුව රජවරුන්ගේ උපදේශකවරු මෙරට බුදු දහමේ උන්නතිය වෙනුවෙන් මහත් කැපකිරීමක් කළහ. දේවානම්පියතිස්ස රජුගේ පටන් බලයට පත් වූ බෞද්ධ පාලකයින් සෑමදෙනෙකුට ම පාහේ උපදේශකත්වය සඳහා භික්ෂූන් වහන්සේ පත්වූහ. ඒ අනුව දුටුගැමුණු රජුගේ උපදේශක වශයෙන් කටයුතු කරනු ලැබුවේ,

(1) කුපික්කල මහාතිස්ස හිමිය. (2) ගෝඨගත්තතිස්ස හිමිය. (3) කොහොන්තිස්ස හිමිය.
(4) කාලබුද්ධරක්ඛිත හිමිය. (5) දිඹුලාගල කාශ්‍යප හිමිය.

47. භික්ෂුණීන් වහන්සේලාට වැඩවාසය කිරීමට ආරාමයක් කරදුන් පාලකයා සහ කරවූ ආරාමය නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,

(1) කාවන්තිස්ස රජතුමා - තිස්සමහා විහාරය. (2) උත්තිය රජතුමා - ජම්බුකෝලපට්ඨන විහාරය.
(3) දේවානම්පියතිස්ස රජතුමා - අශෝකාරාම විහාරය. (4) වළගම්බා රජතුමා - දක්ඛිනගිරි විහාරය.
(5) දේවානම්පියතිස්ස රජතුමා - ඉස්සරසමනාරාමය.

48. මහා විහාරය ජගත් කීර්තියටපත් අධ්‍යාපන ආයතනයක් ලෙස ප්‍රචලිතව පැවැති බවට දැක්විය හැකි ප්‍රබල නිදසුනක් වන්නේ,

(1) පිතිමල්ල, බුද්ධදත්ත, ධම්මපාල, ඡප්පට වැනි හිමිවරුන් අධ්‍යාපනය ලැබීම.
(2) මහා විහාරය මෙරට ඉපැරණි ම අධ්‍යාපන ආයතනයක් වීම.
(3) මහා විහාරය සතුව 364ක් වැනි විශාල සංඛ්‍යාවක් විහාරාම පැවැතීම.
(4) රජවරුන් විශාල ප්‍රමාණයක් මහාවිහාරයට අනුග්‍රහ දැක්වීම.
(5) කාලීන අවශ්‍යතාමත සැකැසුණ විෂය මාලාවක් ක්‍රියාත්මක වීම.

49. ප්‍රාප්ති දානමය පින්කමක් යනු,

(1) ආවාහ - විවාහ මංගල උත්සවයන් නිමිතිකරගෙන භික්ෂූන් වහන්සේලාට ලබාදෙන දානයන්ය.
(2) ගෙට ගෙවදීම නිමිත්තෙන් භික්ෂූන් වහන්සේලාට ලබාදෙන දානයන්ය.
(3) ජීවත්ව සිටින පිරිස් අරබයා භික්ෂූන් වහන්සේලාට ලබාදෙන ජීවදානයන්ය.
(4) අලුත් සහලින් සකස් කොට භික්ෂූන් වහන්සේලාට ලබාදෙන දානයන්ය.
(5) මියගිය අය සිහිපත්කරමින් සත් දින, තෙමස් පූර්ණ හා වාර්ෂිකව භික්ෂූන් වහන්සේලාට ලබාදෙන දානයන්ය.

50. ඉපැරණි ශ්‍රී ලංකාවේ ආරාම කේන්ද්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස ප්‍රකට අෂ්ටමූලායතනවලින් සමහර මූලායතන මහාවිහාරයට අනුබද්ධව පැවැති අතර ඇතැම් ඒවා අභයගිරියට අනුබද්ධව පැවතිණ. පහත දැක්වෙන්නේ එම මූලායතනවලින් කිහිපයකි.

*A.* ගලතුරු මූල *B.* කපාරමූල *C.* උත්තර මූල *D.* විල්ගම්මූල *E.* වහදූමූල

මේවායින් අභයගිරියට අයත් මූලායතන වන්නේ,

(1) *A*, *C* හා *D* ය. (2) *B*, *C* හා *D* ය. (3) *A*, *C* හා *E* ය.
(4) *B*, *C* හා *E* ය. (5) *C*, *D* හා *E* ය.